**මීගමුව අධ්‍යාපන කලාපය**
**දෙවන වාර ඇගයීම - 2025**
**පෙරදිග සංගීතය**

විභාග අංකය:.........................................

| 10 ශ්‍රේණිය | I හා II පත්‍රය | කාලය පැය 03 |
| --- | --- | --- |

**ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**

---

**I කොටස**

- **අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතුරෙන් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.**

(1) නිසගුම ,ප , ගුමගු රි ස යන ස්වර සංගතිය වඩාත් ගැළපෙන රාගය වන්නේ කුමක් ද?
1. යමන් 2. භූපාලි 3. කාෆි 4. භෛරවී

(2) " කළණ මේල ගත " යනුවෙන් අදහස් වන්නේ,
1. කල්‍යාණ රාගයට අයත්බව ය. 2. කල්‍යාණ මේලයට අයත්බව ය.
3. කල්‍යාණ තාලයට අයත්බව ය. 4. කල්‍යාණ ථාඨයට අයත් නොවනබව ය.

(3) ස්වර මාලිකා යනුවෙන් හැඳින්වෙන්නේ,
1. ලක්ෂණ ගීතයි. 2. ස්වර අභ්‍යාසයි. 3. ස්වර සංගතියි. 4. සර්ගම් ගීතයි.

(4) ම, ස ස්වර යනු පිළිවෙළින්,
1. යමන් රාගයේ විවාදී ස්වර වේ. 2. භූපාලි රාගයේ වාදී, සංවාදී ස්වර වේ.
3. භෛරවී රාගයේ වාදී, සංවාදී ස්වර වේ. 4. කාෆි රාගයේ වර්ජිත ස්වර වේ.

(5) /ගරිස- / නිරිස- / පම'ගරි / ග---/ ලෙස යෙදෙන්නේ,
1. යමන් රාගයේ මධ්‍යලය ගීතයේ ය. 2. භෛරවී රාගයේ මධ්‍යලය ගීතයේ ය.
3. යමන් රාගයේ සර්ගම් ගීතයේ ය. 4. කාෆි රාගයේ මධ්‍යලය ගීතයේ ය.

(6) ශාස්ත්‍රීය ගායනයක දී ශ්‍රැතිය පවත්වාගෙන යාමට සුදුසු සහය වාද්‍ය භාණ්ඩය කුමක් ද?
1. වයලීනය 2. සර්පිනාව 3. තබ්ලාව 4. තාම්පුරාව

(7) $ මෙම සංඥාවෙන් කියවෙන වචනය කුමක් ද?
1. Time Signature 2. Sign To Sign 3. Repetation Mark 4.Key Signature

(8) බටහිර සංගීතයේ 6/8 Rhythm ( රිද්මය ) සඳහා ගැළපෙන හින්දුස්ථානි තාලය වන්නේ කුමක් ද?
1. බෙම්ටෝ 2. ජප් තාලය 3. ත්‍රිතාලය 4. ලාවණී තාලය

(9) / සැඳෑ S / කළුවර / කුරග / ගා S වින් / මෙම ගීතයට වාදනය කළහැකි හින්දුස්ථානි තාලය වන්නේ කුමක් ද?
1. ජප් තාලය 2. බෙම්ටෝ තාලය 3. කෙහෙර්වා තාලය 4. දීප්චන්දි තාලය

(10) ගීතයක කොටස් පිළිවෙළින් යොදා ඇති වරණය තෝරන්න.
1. ස්ථායි, අන්තරා, අතුරුවාදනය, පෙර වාදනය
2. පෙර වාදනය, ස්ථායි, අන්තරා, අතුරුවාදනය
3. පෙර වාදනය, ස්ථායි, අතුරුවාදනය, අන්තරා
4. අතුරුවාදනය, අන්තරා, ස්ථායි, පෙර වාදනය

(11) පහත සඳහන් ගීත අතුරෙන් ග්‍රැමෆෝන් ගීතයක් <u>නොවන්නේ</u> කුමක් ද?
1. දැඩිකළ මාතා
2. මහ බෝධි මූලේ
3. සිනිඳු සුදු මුදු තලාවේ
4. විසෙහි විස සඳනා

(12) ගුවන් විදුලියේ තැටිගත කළ මුල් ම සරල ගීතය වන්නේ කුමක් ද?
1. දියගොඩ සැමතැන
2. සිරි බුද්ධගයා විහාරේ
3. ඕලු පිපීලා විල ලෙළදෙනවා
4. ඕලු නෙළුම් නෙරිය රඟාලා

(13) " වරෙන් හීන්සැරේ" ගීතය ගයන ලද්දේ,
1. ආනන්ද සමරකෝන් මහතා ය.
2. සුනිල් ශාන්ත මහතා ය.
3. ආර්. මුත්තුසාමි මහතා ය.
4. නෙවිල් ප්‍රනාන්දු මහතා ය.

(14) කපිරිඤ්ඤා සංගීතය මෙරට ව්‍යාප්ත වූයේ,
1. 1505 දී ය.
2. 1503 දී ය.
3. 1508 දී ය.
4. 1708 දී ය.

(15) සමුද්‍ර ඝෝෂ වීරිතට අනුව ගැයෙන ගී පාදය කි.
1. රූ රුසේ අඳිනා ලෙසේ
2. මන්මත් කරවන දන මුළු දෙරණා
3. සඳවා සුදුවැලි පිවිතුරු
4. පැහැසරණිය මිණිපැමිණිය කොත් අගට

(16) "මන්මත් කරවන දන මුළු දෙරණා" මෙම ගී පාදය අයත් මත් පැදිය වන්නේ කුමක් ද?
1. සොළොස්මත් පැදි
2. අටවිසිමත් පැදි
3. දොළොස්මත් පැදි
4.සූවිසිමත් පැදි

(17) පහත සඳහන් කරුණු අතුරෙන් සේ ගීයක ලක්ෂණයක් <u>**නොවන්නේ**</u>,
1. කතෘ කෙනෙකු සිටීම ය.
2. සරල ගැමි බස් වහර යොදා ගැනීම ය.
3. ලේඛනගතව පැවතීම ය.
4. වියත් පඬිවරුන් විසින් රචනා කිරීම ය.

(18) බුද්ධං සරණේ - සිරස දරාගෙන , මෙම ගී පාදය,
1. සරල ගීය කි.
2. සේ ගීය කි.
3. ගැමි ගීය කි.
4. වන්නම කි.

(19) නිරිස - නිරිගරිස - මෙම ස්වර අභ්‍යාසයේ ඊළඟ පියවර තෝරන්න.
1. නිරිගම' ගරිස-
2. සරිගම' ගරිස-
3. නිරිගරි ගම'ප
4. නිධනිරි ගරිස

(20) නව නාට්‍ය කලාවේ නිර්මාතෘවරයා කවුරුන් ද?
1. ජෝන් ද සිල්වා මහතා
2. එදිරිවීර සරත්චන්ද්‍ර මහතා
3. මකුලොළුව මහතා
4. සී.ද.එස්. කුලතිලක මහතා

(21) ආසාතාත්මක බැති ගී පාදය කි.
1. සීත ගඟුලෙ දී ඇඳ පෙ වෙනවා
2. ඔළිඳ තිබෙන්නේ කොයිකොයි දේසේ
3. අර බලන්න ඉර ගිරවිගෙ පැටියෝ
4. ඔන්න මලේ ඔය නාමල නෙලා වරෙන්

(22) අනාසාතාත්මක ගී වර්ගය කි.
1. කෙළි ගී 2. සමාජයීය ගී 3. පැල් ගී 4. මෙහෙ ගී

(23) "දුප්පත්කමට ගොන් බැඳගෙන දක්කනවා" මෙම ගී පාදය අයත් වන්නේ කිනම් ගී වර්ගයකට ද?
1. පැල් ගී 2. ගොයම් ගී 3. පාරු ගී 4. ගැල් ගී

(24) ශිල්පියෙකු සජීවීව ගැයූ ගීයක් උපකරණ ඇසුරෙන් ඒ අයුරින් ම නැවත ශ්‍රවණය කිරීමට අවකාශය සැලසූ මුල් ම උපකරණය කුමක් ද?
1. ගුවන් විදුලිය 2. ග්‍රැමෆෝනය 3. කැසට් රෙකෝඩරය 4. රූපවාහිනිය

(25) " මැ වේ මා දුටු කොමළ ලියා " යන නව නාට්‍ය ගීතයට ආභාසය ලත් නාඩගම් ගීතය වන්නේ කුමක් ද?
1. ඒ බුදුබව පතමින ලොව්නේ 2. දුල් නිමල් සිසි සේ
3. ගහන රිවි සොම් 4. පින්සරු ධීරා

(26) ගැල් ගී, පැල් ගී, පතල් ගී අයත් වන්නේ,
1. ආසාතාත්මක ජනගී ගණයට ය. 2. සේ ගී ගණයට ය.
3. අනාසාතාත්මක ජන ගී ගණයට ය. 4. ඇඳහිලි ගී ගණයට ය.

(27) ජන ගී වර්ගීකරණයේ දී සමාජයීය ගී ලෙස හැඳින්වෙන්නේ මොනවා ද?
1. මෙහෙ ගී හා සේ ගී 2. ශාන්තිකර්ම ගී හා දරු නැළවිලි ගී
3. තුන් සරණේ ගී හා කෙළි ගී 4. කෙළි ගී හා දරු නැළවිලි ගී

(28) සාමූහිකව ගායනා කරන ජන ගීවල ලක්ෂණයක් වන්නේ කුමක් ද?
1. සංකීර්ණ බස් වහරකින් යුක්ත වීම ය. 2. ආසාතාත්මකව ගැයීම ය.
3. අනාසාතාත්මකව ගැයීම ය. 4. ස්වර පරාසය පුළුල් වීම ය.

(29) දයාවෙන් උපදින අක්ෂර හා බායාවෙන් උපදින අක්ෂර පිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.
1. තා, ගෙ 2. ධි, ගෙ 3. ත, කිට 4. ධා, තිං

(30) දයාවෙන් "න" අක්ෂරයත් බායාවෙන් "ගෙ" අක්ෂරයත් එකවර වාදනය කළවිට උපදින අක්ෂරය වන්නේ කුමක් ද?
1. තිං 2. ගෙ 3. ධි 4. ධා

(31) තබ්ලාව නිර්මාණය කරන ලද්දේ කවුරුන් ද?
1. ජග්ජීත් සිං 2. හරි ප්‍රසාද් චෞරාසියා
3. නිඛිල් බෙනර්ජී 4. අමීර් කුෂ්රු

(32) පහත ගී පාද අතුරෙන් ග්‍රැමෆෝන් ගී පාදය තෝරන්න.
1. මහ බෝධි මුලේ 2. මුහුදු පතුල යට ඉඳලා
3. මැ වේ මා දුටු කොමළ ලියා 4. ඕලු පිපීලා

(33) " දෙපානෝ" ගීත නාට්‍ය නිෂ්පාදනය කරන ලද්දේ,
1. සී.ද.එස්.කුලතිලක මහතා ය. 2. ඩබ්.බී.මකුලොළුව මහතා ය.
3. ලයනල් රන්වල මහතා ය. 4. රෝහණ බැද්දගේ මහතා ය.

(34) සී.ද.එස් කුලතිලක මහතා විසින් ලියන ලද ග්‍රන්ථය කි.
1. අභිනව මූලික ගීත 2. හෙළ ගී මග
3. ලංකාවේ සංගීත සම්භවය 4. සංගීත සංහිතා

(35) “දුලා නෙතු පුලා දිසි ස්වර්ණ ලතා“ යන ගී පාදය කුමන නාට්‍යයේ ඇතුළත් ද?

1. මනමේ නාට්‍යයේ
2. සිංහබාහු නාට්‍යයේ
3. රාජ කපුරු නාට්‍යයේ
4. බෙරහඬ නාට්‍යයේ

(36)  මෙම සංකේතයේ වටිනාකම වන්නේ,

1. මාත්‍රා 02 ය.
2. මාත්‍රා 03 ය.
3. මාත්‍රා 04 ය.
4. මාත්‍රා 1 ½ ය.

(37) $\frac{4}{4}$ මෙම සංකේතයෙන් කියවෙන්නේ බටහිර ස්වර ප්‍රස්තාරයක,

1. Key Signature ය.
2. Tie Mark ය.
3. Time Signature ය.
4. Rest Mark ය.

(38) C සිට E දක්වා (ස සිට ග) ඇති Tone, Semi Tone ප්‍රමාණය වනුයේ,

1. Tone 02 Semi Tone 02 ය.
2. Tone 02 Semi Tone 04 ය.
3. Tone04 SemiTone02 ය.
4. Tone 03 Semi Tone 03 ය.

(39) F Major Scale හි දී විකෘති වන ස්වරය වන්නේ කුමක් ද?

1. $A^{\#}$
2. $C^{\#}$
3. $E^{b}$
4. $B^{b}$

(40) | XXX / XXXX / XXX / XXXX / මෙම රිද්ම රටාවට ව්‍යවහාරික සංගීතයේ දී යොදනු ලබන සංකේතය තෝරන්න.

1. $\frac{7}{8}$
2. $\frac{5}{8}$
3. $\frac{6}{8}$
4. $\frac{3}{4}$

(ලකුණු 1 × 40 = 40)

**දෙවන වාර ඇගයීම 2025 - මීගමුව අධ්‍යාපන කලාපය - පෙරදිග සංගීතය - 10 ශ්‍රේණිය**

## II කොටස

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5 කට **පමණක්** පිළිතුරු සපයන්න.

01. කෙටි පිළිතුරු සපයන්න.

I. රාත්‍රී ප්‍රථම ප්‍රහරයේ ගැයෙන එක් විකෘති ස්වරයක් සහිත නිර්දේශිත රාගයේ ආරෝහණ ස්වර ලියන්න.
II. මග , සරිස , ධනිස   මේ කුමන රාගයක මුඛ්‍යාංගය ද?
III. ස්වර 12 ම යොදාගත හැකි නිර්දේශිත රාගය නම් කරන්න.
IV. |X X | X X X |මෙම රටාවට ගැළපෙන හින්දුස්ථානී තාලය කුමක් ද?
V. දීප්චන්දි තාලයට ගැළපෙන ගී පාදයක් ප්‍රස්තාර කරන්න.(ල 2)
VI. ශ්‍රී ලංකා ගුවන් විදුලි සේවය ආරම්භ කළ වර්ෂය කුමක් ද?
VII. ග්‍රැමෆෝනය මඟින් ජනතාවට මුලින් ම ශ්‍රවණයට සැලසූ ගීත විශේෂය කුමක් ද?
VIII. චල ස්වර 5 ආරෝහණ රටාවට අනුව ලියන්න (ල 2)
IX. ස්වර ප්‍රස්තාරයක කිසියම් සංගීත කොටසක් නැවත එක් වරක් ගායනය / වාදනය කළයුතු බව දක්වන සංකේතයක් ලියන්න.
X. හින්දුස්ථානී තාලයක එක් වරක් පමණක් යෙදෙන තාල සංඥාව කුමක් ද? ( ලකුණු 12 )

02. පහත ස්වර ඛණ්ඩ අධ්‍යයනය කර, දී ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A -| ගගපධ | ප සං - සං | සංරිංගංරිං | සංනිධප
B -| නිසගම | ධමධ නි | සං - සං - | ගං ගං රිං සං

I. ඉහත A හා B රාග 02 නම් කරන්න. ( ලකුණු 02 )
II. A රාගයට අදාළ මධ්‍යලය ගීතයක ස්ථායි කොටසේ ගීත ස්වර ප්‍රස්තාර කරන්න. ( ලකුණු 06 )
III. B රාගයට අදාළව වාදී, සංවාදී, අනුවාදී හා ගාන සමය යන තොරතුරු ලියා දක්වන්න. ( ලකුණු 04 )

03.

I. තබ්ලාවක රූප සටහනක් ඇඳ එහි කොටස් 05 ක් නම් කරන්න. ( ලකුණු 05 )
II. තබ්ලාවේ කොටස් දෙකෙන් වෙන වෙන ම නිකුත්වන අක්ෂර 2 ක් හා එම කොටස් 2 එකතුවෙන් නිකුත්වන අක්ෂර 2 ක් ලියන්න. ( ලකුණු 05 )
III. ලෝක ප්‍රකට භාරතීය තබ්ලා වාදන ශිල්පියෙක් හා ලාංකේය ප්‍රවීණ තබ්ලා වාදන ශිල්පියෙක් නම් කරන්න. ( ලකුණු 02

04.

- සඳවා සුදු වැලි පිච්තුරු
- දොඩම් කපාලා ඇඹුල් තනාලා
- රුරුසේ අදිනා ලෙසේ
- බුද්ධං සරණේ සිරස දරා ගෙන
- වෙල්යායක ගොන් දෙන්නෙක්
- වරමාති සුභ චරිතේ
- දඩිබිඩි ගගා කරනා වැඩ
- මෝරා බීජයෙනා

I. ඉහත ගී පාද ජන ගී වර්ගීකරණය අනුව ගැමි ගී හා සේ ගී ලෙස වෙන් කර ලියන්න.
II. ගැමි ගී නිර්මාණයට හේතු පාදක වූ කරුණු මොනවා ද?
III. ගැමි ගී හා සේ ගී වල සුවිශේෂ ලක්ෂණ 2 බැගින් ලියන්න. (ලකුණු 4 × 3 = 12)

05. පහත සඳහන් ස්වර ප්‍රස්තාර සඳහා Repitation mark යොදා නැවත ලියන්න.

I.

- | සරිග රිසනි |ස - - | රි - -|සරිග රිසනි | ස - - | රි - - |
- | ස - රිග |ස - රිග |
- | ප - ම ග |ප - - - |ප - ම ග|ප - - - | ( ලකුණු 04 )

II. |ග - ම | ප- ග | ම ග | රි - - | මෙම Melody part එක සඳහා Harmony part එකක් ලියන්න.

( ලකුණු 04 )

III. පහත සසඳහන් ස්වර ප්‍රස්තාර සඳහා ව්‍යවහාරික සංගීතයේ දී තාල සලකුණු යොදන්නේ කෙසේ ද?

- | සපප | පපම| පසනි| රිස- |
- |ස-| ප-ප| පප| පධප|
- |ගමප පප-| ගමප පප-|
- |ස-ස| ග-සග| ප-ගප| ස-ස-| ( ලකුණු 04 )

06.

I. කපිරිඥ්ඥා සංගීතයේ ආරම්භය කෙටියෙන් දක්වන්න. ( ලකුණු 04 )

II. කපිරිඥ්ඥා සංගීතයේ ලක්ෂණ 04 ක් ලියන්න. ( ලකුණු 04 )

III. කපිරිඥ්ඥා ගීත ඇසුරෙන් නිර්මාණය වූ ගීත 02 ක් නම් කරන්න. ( ලකුණු 02 )

IV. කපිරිඥ්ඥා ගීත ඇසුරෙන් ගීත ගැයූ ජනප්‍රිය ගායකයින් දෙදෙනෙකු නම් කරන්න.

( ලකුණු 02 )

07. පහත සඳහන් සංගීතඥයන් අතුරෙන් තිදෙනෙක් තෝරාගෙන ඔවුන් පිළිබඳ සුවිශේෂ කරුණු 4 බැගින් ලියන්න.

- ආනන්ද සමරකෝන් මහතා
- සුනිල් ශාන්ත මහතා
- ඩබ්.බී. මකුලොළුව මහතා
- සී.ද.එස් කුලතිලක මහතා ( ලකුණු $4 \times 3 = 12$ )